# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය SINHALA

India's National Spiritual Newspaper ₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

1969 to 2029 ECHO OF HIS CALL SINCE 1969

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XX | YEAR OF OUR LORD JESUS CHRIST, 2026 JULY | Issue No. 08


## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 3:1-8)**

01. ස්වාමීනි, මාගේ විරුද්ධකාරයෝ කොපමණ වැඩිවූද, මට විරුද්ධව නැගිටින්නෝ බොහෝය.

02. දෙවියන්වහන්සේ තුළ ඔහුට ගැලවීමක් නැතැයි මාගේ ප්‍රාණය ගැන කියන්නෝ බොහෝය.

03. නුමුත් ස්වාමීනි, ඔබ මා අවට පළිහක්ද මාගේ ගෞරවයද මාගේ හිස ඔසවන්නාද වනසේක.

04. ස්වාමීන්ට මාගේ ශබ්දයෙන් හඬගසමි, උන්වහන්සේ තමන්ගේ ශුද්ධ කන්දේ සිට මට උත්තරදෙනසේක.

05. මම වැතිර නිදාගතිමි, මම පිබිදුණෙමි. මක්නිසාද ස්වාමීන්වහන්සේ මා දරනසේක.

06. මට විරුද්ධව මා වටකොට රැස්ව සිටින්නා වූ දස දහස් ගණන් සෙනඟට භය නොවන්නෙමි.

07. ස්වාමීනි, නැගුටුණ මැනව, මාගේ දෙවියන්වහන්ස, මා ගැළෙව්වූව මැනව. මක්නිසාද ඔබ මාගේ සියලු සතුරන්ගේ කන්සයට ගැසූසේක, දුෂ්ටයන්ගේ දත් බින්දසේක.

08. ගැළවීම ස්වාමීන්ට අයිතිය. ඔබගේ ආශිර්වාදය ඔබගේ සෙනඟ කෙරෙහි වේවා.

## අපගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අපට පෙනෙන දේට වඩා ක්‍රියා කල හැකියි.

## Our Lord Jesus Christ Can Work Beyond What You Can See!

(සහෝදරී එන්ජලින්)



අපගේ ස්වාමීන් සහ ගැලවුම්කාර වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අනර්ඝ නාමයෙන් උන්වහන්සේගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සාමාජිකයින් සියලු දෙනාටම සුබ පැතුම් පෙතෙමි. උන්වහන්සේගේ කරුණාවෙන් දෙවියන් වහන්සේ විශ්වාසවන්තව 2026 වර්ෂයේ දෙවන කාර්තුවටත් පිවිසීමට අපට හැකියාව ලබාදී ඇත. උන්වහන්සේගේ සාමය, සැනසීම, බහුල අනුග්‍රහය සහ කරුණාව ඔබ සැම කෙරෙහි වේවායි කියා මා ප්‍රාර්ථනා කරමි.

එපීස 3:20 වන පදය සෑම විටම බයිබලයේ සඳහන් මගේ ප්‍රියතම පදවලින් එකකි.

*"ඉතින් අප තුළ ක්‍රියා කරන්නා වූ බලයේ හැටියට අපි ඉල්ලන නොහොත් සිතන හැම දේට වඩා ඉතා අධික ලෙස කරන්ට බලය ඇත්තාවූ තැනැත්තන්වහන්සේටම,"*

අපගේ ස්වාමීන්වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ සියළු අපේක්ෂාවන් ඉක්මවා යන තරම්වටම බලවත්ය. අපට නොපෙනෙන හෝ සිතාගත නොහැකි දේ ඉටු කිරීමට උන්වහන්සේට හැකියාව ඇත. අපට විරුද්ධව ක්‍රියා කරන බව පෙනෙන තත්ත්වයන් අපිට වාසිදායක ලෙස ආශිර්වාදයක් බවට පත්කිරීමට උන්වහන්සේට හැකිය. පසුගිය මාස කිපය තුළ ඔබ අත් විඳ ඇති දේ මම

3 වෙනි පිටුවට ...


Echo of His Call

Christian YouTube Channel!



Every day 2 minutes message by

Pr. S. Sam Selva Raj!

in English, Hindi Language - 1.00 A.M., in Tamil & Telugu Language - 2.00 A.M.

and

Tamil & English Message & Prayer

Sunday 8.30 A.M. & 6.00 P.M.

Please Subscribe if you are blessed! Share with whom you love & care!!

# ECHO OF HIS CALL - (Marching towards 60th year)

Estd. 1969



## from your dearly beloved brother...



### OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Dr. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
EX MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM, MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech, M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.org
YOUTUBE CHANNEL
Echo of His Call

**"...ඔබ මාගේ වැලපීම නැටීමට පෙරළූ සේක..." (ගීතාවලිය 30:11)**

ස්වාමීන් වහන්සේ තුළ ප්‍රිය ප්‍රේමවන්තයෙනි,

අපගේ ස්වාමී වූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අනර්ඝ නාමයෙන් ඔබට සුබ පතමි!

*යුද්ධ සහ යුද්ධ ප්‍රවෘත්ති, ගැටුම්, සාගත, වසංගත, භූමිකම්පා, ඇදහිලිවන්තයින්ට එරෙහිව පැමිණෙන හිංසා පීඩා, මිනීමැරීම්, ඉරිසියාව, බොරු අනාගතවක්තෲවරුන් සහ වැඩි වන නීති විරෝධී ක්‍රියා අවසාන කාලයේ කාලයේදී දකින ලකුණුය කියා යේසුස්වහන්සේම ප්‍රකාශ කළේය.* *(මතෙව් 24:3-12)* අද ලෝකය තුළ මෙම සිදුවීම් දිගහැරෙන ආකාරය අපි දකින විට පැයේ හදිසිභාවය අපට මතක්වෙයි.

එමනිසා අපට තවමත් අවස්ථාව තිබෙන නිසා ශුද්ධ ලියවිල්ලේ මෙම අවවාදයට විශ්වාසවන්තව කීකරු වෙමු.

*'වචනය දේශනා කරපන්න; කලටත් අකලටත් වෑඩේ යෙදී සිටපන්න; සියලු ආකාර ඉවසිලිවන්තකමෙන් සහ ඉගැන්වීමෙන් තරවටුකර, අවවාද කර, අනුශාසනා කරපන්න කියාය'' (2 තිමෝති 4:2)*

මෙම දිව්‍ය වගකීම පිළිබඳව අප සිහි බුද්ධියෙන් යුතුව සිටිය යුතුය. දෙවියන්වහන්සේගේ කරුණාවෙන් චේපාක් සහ සන්තෝෂපුරම්හි *ශාන්ත පාවුළු මෙට්‍රික්‍යුලේෂන් පාසල* සහ නෙහෙමියා බයිබල් විද්‍යාලය ජුනි මස පළමු වන දින ඔවුන්ට දෙමළ භාෂාවෙන් පංති සහ ජූලි 6 වන දින හින්දි භාෂාවෙන් පවත්වන පන්ති නැවත විවෘත කරන බව දැනුම් දීමට අප සතුටු වෙමු. මීට අමතරව නෙහෙමියා බයිබල් විද්‍යාලයේ උපාධි ප්‍රධානෝත්සවය 2026 ජූලි 4වන දින පැවැත්වේ.

අප බොහෝ විට අධික වගකීම් සහ අධික වැඩ වලින් බර වී සිටියත් අපගේ යුතුකම් ඉතා සාර්ථකව ඉටු කිරීම සඳහා දෙවියන් වහන්සේ අපව ශක්තිමත් කරයි.

මෙම සේවාවන් ඉතා ඵලදායී ලෙස ඉදිරියට ගෙනයාම සඳහා අපට දූරදර්ශී, විශ්වාසවන්ත සහ කැපවූ සේවකයින් අවශ්‍ය වී තිබේ. ඉංග්‍රීසි සහ හින්දි භාෂාව පිළිබඳව ප්‍රවීණ සහකාර විදුහල්පතිවරුන්, ගුරුවරුන් කළමනාකාරවරුන්, ලේකම්වරුන්, කාර්යාල කාර්ය මණ්ඩලය, මුද්‍රණ සේවකයන්, ගෘහ පාලනය, කාර්ය මණ්ඩලය, කාන්තා කෝකියන්, ආරක්ෂක නිලධාරීන්, රියදුරන් සහ දේවගැතිවරුන් සේවය සඳහා විශේෂ අයදුම්පත් තුළින් සහ යාච්ඤාවෙන් අපි ආරාධනා කරමු.

ස්වාමීන්වහන්සේ එවන ආකාරයට අවංක හා දක්ෂ පුද්ගලයින් බඳවා ගැනීමට සහ ඔවුන්ට සහාය දීමට අපි සූදානම්ව සිටිමු. දෙවියන්වහන්සේ තම කාර්යය සඳහා සුදුසු පුද්ගලයින් නැගිටුවන ලෙස කරුණාවෙන් යාච්ඤා කරන්න.

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) · BIBLECOR - Postal Courses (3 languages) · YouTube Ministry · Online Courses · Theological Correspondence Courses (2 languages) · Church Planting · Nehemiah Bible Colleges · Gospel Printing Press · Great Commission Partners · St. Paul's Matriculation School · Crusades · Community Development

*'.....ගොයම නම් බොහෝය, නුමුත් ගොවියෝ ස්වල්ප දෙනෙක්ය. එබැවින් තමන් ගොයම් කැපීමට ගොවියන් එවන ලෙස ගොයමේ ස්වාමියාට යාච්ඤාව කරපල්ලා." (මතෙව් 9:37-38)*



***Some of the students who will be graduating from the Nehemiah Bible Colleges on 04-07-2026.***

නෙහෙමියා බයිබල් විදුහලේ පීඨ රැස්වීම 2026/05/16 දින පැවැත් වූ අතර එහිදී උපාධි ප්‍රදානෝත්සවය සහ ඊළඟ අධ්‍යයන වර්ෂය 2026 - 2027 පිළිබඳව සාකච්ඡා කරන ලදී.

ස්වාමීන්වහන්සේට විශ්වාසවන්තව, කඩිසරව සහ දෙවියන්වහන්සේට බියෙන් සේවය කිරීමට අපට උපකාර ලැබෙන පිණිස ඔබගේ ගණන් කළ නොහැකි යාච්ඤාවන් සහ සහයෝගය අපට ලබා දෙන්නය කියා ඉතා නිහතමානීව ඉල්ලා සිටිමු.

ඔබ සහ ඔබගේ පවුලේ සියලු අවශ්‍යතාවලට පිළිතුරු ලබා දෙන්නේ කියා අපේ යාච්ඤා කරමු. එසේම ඔබගේ සියලු අවශ්‍යතා උන්වහන්සේගේ තේජසේ සම්පතේ ප්‍රකාරයට අනුව ඉටු වන පිණිස යාච්ඤා කරමු. දෙවියන්වහන්සේගේ කරුණාව ඔබ සැම සමඟ වේවා. ආමෙන්!

*In Christ Jesus, your servant,*

**Pr. S. Sam Selva Raj**

E.mail : sam@echoofhiscall.org

*1 පිටුවෙන්....*

නොදන්නවා වියහැක. නමුත් ඔබව නින්ද නොමැති රාත්‍රීන් ඇති කළා වූ එම සියලු දේවල් පවා යහපත සඳහා සියල්ල එකට ක්‍රියාත්මක කිරීමට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ බලවත් බව ඔබට සහතික කිරීමට කැමැත්තෙමි.

*හග්ගයි 2:6 වන පදය අපට මෙසේ කියවීමට හැකිය*

*"මක්නිසාද සේනාවල ස්වාමීන් වහන්සේ මෙසේ කියන සේක: මම ටික කලකින් තව වරක් අහස සහ පොළොවත් මුහුද සහ ගොඩත් සොලවන්නෙමි."*

තව ටික කලකින් මම නැවතත් අහසත් පොළවත් සොලවන්නෙමි. දෙවියන්වහන්සේට තම අරමුණු ඉටු කර ගැනීම සඳහා අහස සහ පොළොව සොලවන්නට පුළුවන් බව



***In a little while I will once more shake the heavens and the earth...***

ඔබට සිතා ගත හැකිද? විශ්වය මැවුම්කරුට ඔබටත් මටත් වාසිදායක ලෙස සියල්ල වෙනස් කළ හැකිය.

ආදරණීය සහෝදරයා සහෝදරිය, සටන් බොහෝ විට අපගේ ජීවිත තුළ දෙවියන් වහන්සේගේ කැඳවීම ඉටු කිරීමෙන් අපව වෙනතකට යොමු කරයි. යක්ෂයා අපගේ අවධානය නැතිකර අවධානය යොමු නොකළ යුතු දේ වෙතට යොමු කරයි. ඔහු මෙය කරන්නේ කෙසේද? අභ්‍යන්තර හා බාහිර ගැටලු හඳුන්වා දීමෙන්ය.

දෙවියන්වහන්සේ අපව පිටත සටන්වලට මුහුණ දීමට කැඳවන විට සතුරා අපගේ පවුල් තුළ සහ සභාව තුළ කැලඹීම් ඇති ඇති කරයි. එවිට අපට අවධානය නැතිවෙයි. පිටත ගිනි නිවා දැමීම වෙනුවට අපගේම නිවෙස් තුළ ගින්නක් සමඟ සටන් කිරීමට අපට සිදුවෙයි. යක්ෂයා අපව රවටා ගන්නා පිණිස;

දෙවියන් වහන්සේ අපට පිටතින් එන කරදරවලට මුහුණ දීමට කැඳවන විට සතුරා ඇතුළත කැලඹීම් ඇතිකරයි.....




***When God calls us to confront battles outside the enemy creates disturbances within . . .***

සැබෑ සතුරා වන යක්ෂයා සිංහයෙකු මෙන් එළිමහනේ බලා සිටින අතර අපගේම පවුලේ සාමාජිකයින් හෝ සෙසු ඇදහිලිවන්තයින්ව සතුරන් ලෙස දැකීමට සලස්වයි.

එස්රා සහ හග්ගයි යන පොත් දෙක තුළින්ම පැහැදිලි කරන්නේ ඊශ්‍රායෙල්වරුන්ට ඔවුන්ගේ වසර 70ක වහල් භාවයෙන් පසු දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීම සඳහා අභ්‍යන්තර හා බාහිර අභියෝගයන් ජයගැනීමට සිදුවූ ආකාරයයි. මෙම අරගල තුළින් දෙවියන් වහන්සේ ඔවුන්ගේ අපේක්ෂාවන්ට වඩා බොහෝ සෙයින් ක්‍රියා කරන ආකාරය ඔවුන් දුටුවේය.

**බාහිර අභියෝග** (එස්රා 5වන පරිච්ඡේදය)

දේව මාලිගාව නැවත ගොඩනැගීමේදී ජනතාවට දැඩි බාහිර විරෝධයකට මුහුණ දීමට සිදුවිය.



***The people faced intense external pressure during the rebuilding of the temple***

* අඛණ්ඩ පැමිණිලි සහ විරෝධය
* අසල්වැසි බලධාරීන්ගෙන් ඔවුන්ගේ අධිකාරිත්වය සම්බන්ධයෙන් ආකූලම්කලිදි ප්‍රශ්න කිරීම
* දාරියුස් රජු සයිරස් රජුගේ නියෝගය විමර්ශනය කළ ආකාරය පිළිබඳ දේශපාලන පරීක්ෂාව



**Political scrutiny, as King Darius investigated the decree of King Cyrus**

**අභ්‍යන්තර නියෝග (හග්ගයි)**

* කලින් දේවස්ථානය සමඟ නිරන්තර සංසන්දනය
* බලාපොරොත්තු සුන් වීම නිසා බිය සහ අධෛර්යය වීම ඔබය හුරුපුරුදු බවක් දැනෙනවාද?
* අපි දෙවියන් වහන්සේට සමීප වීමට පියවරක් තැබූ විට
* අප දෙවියන් වහන්සේට ප්‍රසන්න ජීවිතයක් ගත කිරීමට තෝරා ගන්නා විට
* අප උන්වහන්සේගේ කැඳවීම අපගේ ජීවිතවලට ඉටු කිරීමට උත්සාහ කරන විට

අපට අභ්‍යන්තර හා බාහිර පීඩාවන් සමාන ආකාරයෙන් මුහුණ දීමට සිදු නොවන්නේද?


මෙම බාධාවන් නොතකා අප අතරින් කී දෙනෙක් ඉදිරියට ගොස් තිබේද? දෙවියන් වහන්සේ අපට දුන් සිහින සහ කැඳවීම කීදෙනෙක් අත්හැර දමා තිබේද?

දෙවියන්වහන්සේ අද අපට මතක් කර දෙන්නේ: අප සේවය කරන්නේ මුළු ලෝකයම සෙලවීමට හැකි දෙවි කෙනෙකුට බවයි. උන්වහන්සේගේ අරමුණ අපගේ ජීවිතය තුළින් ඉෂ්ට කරයි. ප්‍රශ්නය නම්: අප කැමතිද?

## 1). අභ්‍යන්තරව මුහුණ දෙන අභියෝග!

ඊශ්‍රායෙල් සෙනඟ දේව මාලිගාව නැවත ගොඩනැඟීම ආරම්භ කළ විට්දී ඔවුන් සංසන්දනය කිරීමේ ආත්මය සමඟ අරගල කළහ. අපගේ ජීවිතවල අප නොදැනුවත්වම මුහුණ දෙන්නා වූ අභියෝග නම් වයස, ස්ත්‍රී පුරුෂ භාවය හෝ තමාගේ ජාතිකත්වය පිළිබඳව සංසන්දනය කිරීමයි.

අපි අපගේ ජීවිත අන් අය සමඟ සංසන්දනය කරමු. අපගේ නිවස, වාහන, රැකියාව, වැටුප, සම්පත්වලින්, අධ්‍යාපනය,



**We compare our lives with others**

අපි අපගේ ජීවිතය අන් අය සමඟ සංසන්දනය කරමු. දරුවන් අපගේ දේව සේවය සහ කැපවීම සම්බන්ධව සංසන්දනය කරමු. අප එසේ කිරීමෙන් දෙවියන් වහන්සේගේ දිව්‍ය සැලසුමේ කොටසක් ලෙස අපව නිර්මාණය කර තිබේදැයි කියා හඳුනා ගැනීමට අප අසමත් වෙමු.

බාහිර සතුරන්ට මුහුණ දීමට ඊශ්‍රායල් සෙනඟ තමන් තුළම සටනකට මුහුණ දීමට සිදුවිය. ඔවුන් නව දේව මාලිගාව පෙර තිබූ දේවමාලිගාව සමඟ සංසන්දනය කළ අතර ඔවුන්ගේ කාර්යය සහ දෙවියන් වහන්සේ දැනටමත් ඔවුන් වෙනුවෙන් කර ඇති දේවල් යන දෙකම අවතක්සේරු කළහ. ඔවුන්ව වහල් භාවයෙන් ආපසු ගෙන ඒම සහ සයිරස් සහ දාරියුස් වැනි මිථ්‍යා දෘෂ්ටික රජවරුන් ගෙන් ඔවුන්ට අනුග්‍රහය ලබාදීමත් දෙවියන් වහන්සේගේ ආශ්චර්යමත් ක්‍රියාව අමතක කිරීමට මෙය හේතු කාරණාවක් විය. අප සංසන්දනය කරන විට අපි කෘතඥ නොවෙමු. මෙය අධෛර්යමත් වීමට, බලාපොරොත්තු සුන් වීමට සහ චිත්තවේගීය පීඩාවට හේතු කාරක වෙයි.

*"මේ ගෘහය එහි පළමු තේජස ඇතුව තිබෙද්දී එය දුටු අයගෙන් තුමලා අතරේ ඉතිරිව සිටින්නේ කවුද?....." ( හග්ගයි 2:3)*

* අලුත් දේව මාලිගාව කුඩා විය
* සම්පත් සීමිත විය
* සාලමොන්ගේ දේවමාලිගාවේ තේජස ඔවුන්ගේ වර්තමාන කාර්යයන් යටපත් කළේය
* මිනිසුන් කලක් නටබුන් වී තිබූ දේව මාලිගාව නැවත ගොඩ නගමින් සිටිති



**Who of you is left who saw this house in its former glory?**

....Contd. to page 6




**ඉතා හදිසි දැනුම් දීමක්!**

අපගේ ලිපිනය:

ECHO OF HIS CALL,
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005, India
Cell: (+91) 98412 71858 / 98410 71858 E.mail: mm@echoofhiscall.org

ඉදිරියේදී කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තැපැල් මගින් යැවීමේදී නොවැළැක්විය හැකි බාධාවන් ඇතිවීමට හැකිය. එබැවින් ඔබට කිසිදු බාධාවකින් තොරව කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව දිගටම ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර ඔබගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් සහ whatsapp අංකය සඳහන් කර ලිපියකින්, විද්‍යුත් තැපෑලෙන්, දුරකථන ඇමතුමකින් හෝ sms / Whatsapp පණිවිඩයක් හරහා ඉක්මනින්ම අප වෙතට ලැබෙන්නට සලස්වන්න.

ඔබගේ සහයෝගය අපට ඔබට හොඳින් සේවය සලසා දීමට උපකාරී වෙයි!

GREAT COMMISSION PARTNERS

ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**ජූලි:19** - අපගේ සියළුම සහකාර කර්තෘවරුන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**ජූලි:20**- අපගේ ප්‍රධාන සභාවට තවත් නව ඇදහිලිවන්තයින් එකතු කර තිබෙන නිසා, ස්තුති කරන්න.

**ජූලි:21** - අපගේ නේවාසික සහ සන්ධ්‍යා තෙහෙමියා බයිබල් විද්‍යාලයේ පාඨමාලා සඳහා නවක සිසුන් ඇතුළත් කර ගැනීමට කරුණාවෙන් උපකාර කල නිසා, ස්තුති කරන්න.

**ජූලි:22**-- අපගේ තරුණ හා ළමා ආරක්ෂණ සේවයේ ගෝලිය දැක්මට ආශිර්වාද කර තිබෙන නිසා, ස්තුති කරන්න.

**මැයි:23** - ළඟා නොවූ ප්‍රදේශවලට සුභ ආරංචිය පතුරුවා හැරීමට අපට හැකියාව ලබාදීම නිසා, ස්තුති කරන්න.

**ජූලි:24**- 1969 වන වර්ෂයේ සිට අපගේ සගරා සේවයට උන්වහන්සේ බලවත් ලෙස ආශිර්වාද කර තිබෙන නිසා, ස්තුති කරන්න.

**ජූලි:25**- බලාජි නගර්, සන්තෝෂපුරන් සහ වේලච්චේරිහි අපගේ ඉරුදින දේව මෙහෙයන්ට සහභාගී වන නව ඇදහිලිවන්තයින් නිසා, ස්තුති කරන්න.

**ජූලි:26**- අපගේ You Tube නාලිකාව හරහා විකාශනයවන විනාඩි 7ක පණිවිඩය, ළඟා නොවූ පුද්ගලයින් වෙත ළඟා වන පිණිස ආශිර්වාද කර තිබෙන නිසා, ස්තුති කරන්න.

**ජූලි:27**- අපගේ මුද්‍රණාලයේ සේවකයින්ගේ ක්‍රියාකාරීත්වයන් තුලින් අඛණ්ඩ, කාර්යක්ෂම සේවයක් ඉටුවන නිසා, ස්තුති කරන්න.

**ජූලි:28**- ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසල, නෙහෙමියා බයිබල් විද්‍යාල සහ තැපැල් මාර්ගිකව දේවධර්ම පාඨමාලාවේ සියලුම ක්‍රියාකාරීත්වයන් නිසා, ස්තුති කරන්න

**ජූලි:29** - අපගේ ප්‍රධාන සභා පාලක එස්. සෑම් සෙවරාජ් සහ ඔහුගේ පවුලේ අයට බලවත් ලෙස ආශිර්වාදය කර තිබෙන නිසා, ස්තුති කරන්න.

**ජූලි:30**- අපගේ ආධාර කරුවන්ගේ යාච්ඤාවන් සහ විශ්වාසවන්ත සහයෝගයට ආශිර්වාද කර තිබෙන නිසා, ස්තුති කරන්න.

**ජූලි:31** - ලෝකවාසී ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරන පිණිස දොරවල් විවෘත කර තිබෙන නිසා, ස්තුති කරන්න.

**අගෝ:01**- ශ්‍රී ලංකා දේශය තුළ සුභාරංචිය ප්‍රකාශ කිරීමට දොරටු විවෘත කර තිබෙන නිසා, ස්තුති කරන්න.

**අගෝ:02**- ශ්‍රී ලංකා දේශය තුළ සේවය කරන කිතුනු දේවදාස දාසීන් සියලුම දෙනාට සහ ඇදහිලිවන්තයින්ට දෙවියන්වහන්සේගේ කරුණාව සපයා දී තිබෙන නිසා, ස්තුති කරන්න.

**අගෝ:03**- ශ්‍රී ලංකා දේශයට දෙවියන්වහන්සේගේ විශේෂ ආරක්ෂාව සහ සැපයීම ලබා දී තිබෙන නිසා, යාච්ඤා කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**අගෝ:04**- ළඟා නොවූ ස්ථානවලට ශුභාරංචිය පතුරුවා හැරීමට හැකියාව ලබා දෙන පිණිස, යාච්ඤා කරන්න.

**අගෝ:05**- සියලු ආගම්වල සිටින ජනතාව අතර සාමය සහ සමගිය ඇතිවන පිණිස, යාච්ඤා කරන්න.

**අගෝ:06**- දෙවියන්වහන්සේ ඉදිරියෙහි ලෝකයේ ජීවින සියලු ජාතීන් අතර අඛණ්ඩව සාමය පවතින පිණිස, යාච්ඤා කරන්න.

**අගෝ:07**- සියලුම කිතුණු සංවිධාන සහ සේවාවන් වලට දෙවියන්වහන්සේගේ ආශිර්වාදය හා සාමය ලැබෙන පිණිස, යාච්ඤා කරන්න.

**අගෝ:08**- අපගේ දේව සේවයේ 58 වන වසරට පිවිසෙන විටදී දෙවියන් වහන්සේගේ ආශිර්වාද ලැබෙනන පිණිස, යාච්ඤා කරන්න.

**අගෝ:09**- අපගේ ප්‍රධාන පාලකතුමා වන එස්. සෑම් සෙල්වරාජ් විසින් සැලසුම් කර තිබෙන සියලු කාරණා වලට දෙවියන්වහන්සේගේ මඟ පෙන්වීම හා ආශිර්වාදය ලැබෙන පිණිස, යාච්ඤා කරන්න.

**අගෝ:10**- ලොව පුරා සේවය කරන කිතුණු සේවක සේවිකාවන්ට දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලැබෙන පිණිස, යාච්ඤා කරන්න.

**අගෝ:11** - අපගේ ප්‍රධාන දේවගැති තුමා විසින් ඔහුගේ චරිත කතාව රචනා කිරීම ඉතා සාර්ථකව ඉටු කරන පිණිස හා ඔහුගේ පවුල සියලු නපුරු බලවේග වලින් ආරක්ෂා කරන පිණිස, යාච්ඤා කරන්න.

**අගෝ:12**- රුසියාව සහ යුක්රේනය අතර පවතින යුද්ධයත් ලොව පුරා නොයෙකුත් රටවල් අතර පවතින සෑම යුද්ධයක්ම අවසන් වන පිණිස, යාච්ඤා කරන්න.

**අගෝ:13** - අපගේ සේවයේ සම්බන්ධීකාරකවරුන් හා දේවගැතිවරුන්ට ශක්තිය හා ධෛර්යමත් කම ඇතිවන පිණිස, යාච්ඤා කරන්න.

**අගෝ:14**- කිතුනු පවුල් බෙදීමට උත්සාහ කරන යක්ෂයාගේ නපුරු ක්‍රියා විනාශ වන පිණිස, යාච්ඤා කරන්න.

**අගෝ:15**-- නිවාඩු කාලීන බයිබල් පාසල(VBS)තුළ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමයෙන් ස්පර්ශ වූ සිය ගණන් දරුවන් උන්වහන්සේ තුළ ස්ථිරව සිටීමට හා විශ්වාසවන්තව සභාවට යාමට හැකිවන පිණිස, යාච්ඤා කරන්න.

**අගෝ:16**-- ශ්‍රී ලංකා දේශය තුළ පවතින ඩෙංගු වසංගත රෝගය සහ අනෙකුත් වසංගත රෝගවලින් මිනිසුන්ව ආරක්ෂා කර දෙන පිණිස, යාච්ඤා කරන්න.

**අගෝ:17**-- රට තුළ ව්‍යාප්තව පවතින මත්පැන් හා මත් ද්‍රව්‍ය ව්‍යාපාරය නිසා විනාශ වන දරුවන් හා තරුණ පරම්පරාව ආරක්ෂා කර දෙන පිණිස, යාච්ඤා කරන්න.

**අගෝ:18**-- ශ්‍රී ලංකා දේශය තුළ සිටින රාජ්‍ය නායකයන්ට රට පාලනය කිරීමට අවශ්‍ය ප්‍රඥාව ලැබෙන පිණිස හා රට තුළ සමාදානය ඇතිවන පිණිස, යාච්ඤා කරන්න.

....Contd. from page 4

ඔවුන්ට හඬවල් දෙකක් ඇසුණු බව බයිබලය පවසයිː

1. පළමු දේව මාලිගාව දුටු අයගේ හඬ - වර්තමාන දේව ගෘහයේ ව්‍යුහය වසර ගණනාවකට පෙර ඔවුන් දුටු ගෘහයේ තේජසට සංසන්දනය කරන විට ශෝකයේ සහ වේදනාවේ කෑ ගැසීම.
2. වත්මන් පරම්පරාවේ හඬ, ඔවුන්ගේ විශිෂ්ට ජයග්‍රහණය ගැන ප්‍රීතියෙන් කෑ ගසයි. දෙවැන්න කලින් සිටි තැනැත්තාට වඩා වැඩි විය හැකි යැයි සිතුවද, වඩාත් කැපී පෙනෙන ලෙස දෝංකාර දුන්නේ ශෝකයේ හඬයි.

එහෙත් අධෛර්යමත් කිරීමේ හඬ වඩාත් උස් විය.

කෙසේ වෙතත් එස්රා 6 වන පරිච්ඡේදය ගැඹුරු සත්‍යයක් හෙළි කරයි. පෙර දේවමාලිගාවෙහි සාලමොන්ගේ ධනය තිබුණි. එමෙන්ම එයට දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ අරමුණක් දී තිබුණි.

* මිථ්‍යා දෘෂ්ටික රජවරුන්ගෙන් බලාපොරොත්තු නොවූ ප්‍රතිපාදන ලැබුණි

* එහි කාර්යයන් දිව්‍ය අධිකාරිත්වය යටතේ නිම කරන ලදී

* රජු විසින් රැකවරණය ලබා දෙන ලදී

* නමස්කාරය යථා තත්ත්වයට පත්විය

*''මේ ගෘහයේ අන්තිම තේජස පළමු එකේ තේජසට වඩා මහත් වන්නේ යැයි සේනාවල ස්වාමීන් වහන්සේ ස්වාමීන් වහන්සේ කියන සේක."*

*(හග්ගයි 2:9)*



***The glory of this present house will be greater than the glory of the former house," says the LORD Almighty***

*මෙම උතුම් තේජසේ ප්‍රමාණය රත්තරන් ගැන නොවේය. එය මෙසේ වියː*

* විපත්ති දවසේදී දෙවියන් වහන්සේගේ විශ්වාසවන්තකම

* යටහත් සහ කීකරු ජනතාව අතර උන්වහන්සේගේ අභිමුඛත්වය

* වඩා වැදගත් දෙය නම්, යේසුස් ක්‍රිස්තුස් වහන්සේම පසුව මෙම දේව මාලිගාවට පැමිණීමයි.

ඔවුන් දෙවියන් වහන්සේගේ ක්‍රියාව සංසන්දනය කළ නිසා අගය කිරීම සම්බන්ධයෙන් ඔවුන් අන්ධ විය. නමුත් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ දයාවෙන් නියම වේලාවට අපව නගා සිටුවීමට දිරිගැන්වීමක් එව්වේය.

ශක්තිමත් වන්න!

*අනාගත වක්තෘ හග්ගයි තුළින් දෙවියන් වහන්සේ අනාගත මෙසේ කතා කරයි. (හග්ගයි 2:4)*

*''එහෙත් සෙරුබ්බාබෙල් දැන් බලවත්ව සිට පන්න .....''*

*යෙහෝෂාදාගේ පුත්‍ර වූ උත්තම පූජකයා වූ යෝෂුවා නුඹත් බලවත්ව සිටපන්න.....*

*නුඹලාත් බලවත්ව...... වැඩ කරපල්ලා..... මක්නිසාද මම නුඹලා සමග සිටිමි......"*

*''............ තුන් වතාවක් දෙවියන් වහන්සේ දැඩි ලෙස අණ කරයි - උන් වහන්සේගේ පැමිණීම ඔවුන්ට සහතික කරයි. - මාගේ ආත්මයත් නුඹලා අතරෙහි පවතින්නේය බිය නොවෙල්ලා" (හග්ගයි 2:5)*

අද දෙවියන් වහන්සේ මෙසේ පවසයි; ශක්තිමත්ව සිටින්න. ඔබ කුමනාකාර දෙයක් දකිනු ලැබුවත් මම ඔබ සමග සිටිමි.

මෙය යෝෂුවාට දුන් පොරොන්දුවම වෙයි

*''.......... ශක්තිමත්ව ධෛර්යවත්ව සිටපන්න; තැති නොගනින්න, නොකැලඹෙන්න. මක්නිසාද නුඹ යන සෑම තැන්හිම නුඹේ දෙවිවූ ස්වාමීන් වහන්සේ නුඹ සමග සිටින සේක."*

*(යෝෂුවා 1:9)*

යෙසායා 41:10 හි එම සහතිකයම ලබා දී ඇත

*''භය නොවෙන්න, මක්නිසාද මම නුඹ සමග සිටිමි; තැති නොගනින්න, මක්නිසාද මම නුඹේ දෙවියන් වහන්සේය. මම නුඹ ශක්තිමත් කොට, නුඹට උපකාර කරන්නෙමි; එසේය, මාගේ ධර්මිෂ්ඨකම නමැති දකුණතින් ඔබ උසුලන්නෙමි."*

අප සංසන්දනය කරන විට අධෛර්යමත් වීම සහ බිය ඇතිවීම සිදුවෙයි. අප අන් අය සමග සංසන්දනය කිරීම නැවැත්විය යුතුයි අපට ස්වර්ගීය කැඳවීමක් තිබේ.



***I will hold your right hand and uphold you.***

## (2). බාහිරව අභියෝගවලට මුහුණ දෙයි!

අභ්‍යන්තර අරගල සම්බන්ධව කතා කිරීමෙන් පසු ඊශ්‍රායල්වරු ඔවුන්ගේ ප්‍රාදේශීය බලධාරීන්ගේ බාහිර විරෝධයට මුහුණදුන්හ.

''මේ දේව මාලිගාව ගොඩනගා මේ පවුර නිම කිරීමට ඔබට අණ කළේ කවුද?"

විරුද්ධ වීම යන්නෙන් අදහස් වන්නේ දෙවියන් වහන්සේ අපව අත්හැර දමා ඇති බව නොවේය. දෙවියන්වහන්සේ අප වෙනුවෙන් සැබවින්ම ක්‍රියා කරන විට සහ යමක් උන්වහන්සේගේ කැමැත්තට අනුකූලව නොවන බව හඳුනා ගැනීමට අපට ආත්මික සහජ බුද්ධිය අවශ්‍ය වෙයි. විශේෂයෙන් අප උන්වහන්සේගේ කැමැත්තට කීකරුව ගමන් කරන විට උන්වහන්සේගේ රාජ්‍යයේ දියුණුව සඳහා; අප මුහුණ දෙන සෑම විරුද්ධත්වයක්ම දෙවියන්වහන්සේට භාවිතා කළ හැකිය.

- ★ දාවිත් ගොලියත්ට මුහුණ දුන්නේය
- ★ නෙහෙමියා සන්බලාට සහ ටෝබියාට මුහුණ දුන්නේය.
- ★ පාවුල් යුදෙව් විරුද්ධවාදීන්ගේ පීඩා වලට මුහුණ දුන්නේය
- ★ මුල් කිතුණුවන් සෑම ස්ථානයකම විරුද්ධවාදී කම්වලට මුහුණ දීමට සිදුවිය
- ★ එහෙත් මේ සියලු අවස්ථාවන්වලදී දෙවියන් වහන්සේගේ නාමය මහිමයට පත් විය.

ඒ හා සමානවම මෙම පරිච්ඡේදයේදී අපිට විරුද්ධවාදීකම් මතුවන ආකාරය දැක ගත හැකිය. මිනිසුන් තම රැකියාව, පවුල සහ සුවපහසු ජීවිතය අතහැරදමා නටබුන් වූ දේවමාලිගාව නැවත ගොඩනගා තිබුණි. ඔවුන් විශාල කැපකිරීම් කර තිබුණි. එහෙත් අගය කිරීම වෙනුවටත් දිරිගැන්වීම වෙනුවටත් ඔවුන්ට ලැබුණේ පැමිණිලි කිරීමේ විවේචන ලිපි වන අතර ඔවුන්ගේ කාර්යය කාර්ය නිරන්තරයෙන් අභියෝගයට ලක් විය.

මිනිසුන්ගෙන් පිළිගැනීමක් බලාපොරොත්තු නොවන්න. දෙවියන් වහන්සේම අපගේ විපාක දෙන්නාය. උන්වහන්සේගේ කැමැත්තට විශ්වාසවන්තව සිටීම දිගටම පවත්වාගෙන යන්න.

ආදරණීය මිතුවරුනි, ඔබ විරුද්ධවාදී කම්වලට මුහුණ දෙනවා නම් බිය නොවන්න. *"නමුත් ඔවුන්ගේ දෙවියන් වහන්සේගේ ඇස යුදෙව්වරුන්ගේ වැඩිමහල්ලන් කෙරෙහි විය''* අපගේ ස්වාමීන් වහන්සේගේ ඇස් අදටත් අප කෙරෙහි ඇත. මෙය ඔබට වචනයක් විය හැකිය. ඔබට විරුද්ධව ආයුධ සෑදිය හැකිය, නමුත් ඒවා සඵල නොවෙනු ඇත. චෝදනා මතුවිය හැක, නමුත් ඒවා විරුද්ධවාදීව නැඟී නොසිටිනු ඇත. දෙවියන්වහන්සේ කළේ කුමක්ද?

උන්වහන්සේ සටන් කරන විට: *"මම අහස සහ පොළොවත් සොලවන්නෙමි."*
*(හග්ගයි 2:21)*

සෑම දෙයක්ම ඔවුන්ට විරුද්ධ බව පෙනෙන්නට තිබුණි, එස්රා 6:12 හි අප මෙසේ කියවමු.

*"...... දාරියුස් නම් මම නියෝගයක් කෙළෙමි, එය ඉක්මනින් ඉෂ්ට කරනු ලැබේවා."*

ඔවුන්ට එරෙහිව පැමිණිල්ලක් කලා වූ රජතුමාම දැන් ඔවුන්ගේ වැඩ කටයුතු බාධාවකින් තොරව අවසන් කළ යුතු බවට නියෝගයක් නිකුත් කළේය.

- ★ ඔහු නිල වශයෙන් නැවත ගොඩනැගීම තහවුරු කළේය: දෙවියන් වහන්සේගේ මේ ගෘහයේ වැඩ කෙරීගෙන යියාවේ. (එස්රා 6:7)
- ★ ඔහු මෙම ව්‍යාපෘතියට රාජකීය භාණ්ඩාගාරයෙන් සම්පූර්ණයෙන්ම අරමුදල් සපයා දෙන ලෙස නියෝග කළේය. (එස්රා 6:8)
- ★ නමස්කාරය සඳහා අවශ්‍ය සියලුම දේ දිනපතා සපයන බවට ඔහු සහතික විය. (එස්රා 6:9-10)
- ★ වැඩ කටයුතු වලට බාධා කිරීමට උත්සාහ කරන ඕනෑම කෙනෙකුට දැඩි දඬුවම් නියම කරන බවට ඔහු අනතුරු ඇඟෙව්වේය. (එස්රා 6:11-12)

දාරියුස් රජුගේ ප්‍රතිචාරය හුදෙක් සහයෝගය දැක්වීමක් පමණක් නොවේ - එය ආරක්ෂිත සහ ත්‍යාගශීලී එකක් විය.

....Contd. to page 10

NEHEMIAH BIBLE COLLEGES,
Chepauk & Santhoshapuram, Velachery Chennai.
Rush for admission!
Medium : Tamil (Part Time)
Hindi (Part Time)
Diploma in Theology &
Bachelor of Theology
Qualification :
10th Standard & above
Contact :
The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
Recognised by
International Christian Leaders &
Senior Pastors for the past 56 years



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

"...කියවන්නා තේරුම් ගනීවා...." (මතෙව් 24:15)

## අපගේ සභාවන් වලට ශක්තිමත් කුළුණු අවශ්‍යයි!

*"ජයගන්නා මාගේ දෙවියන් වහන්සේගේ මාලිගාවෙහි කණුවක් කරන්නෙමි." (එළිදරව් 3:12)*



මගේ තරුණ කාලයේදී, මා චෙන්නෙයි අපෝස්තලික කිතුණු සභාවේහි දැඩි ලෙස මුල් බැසගෙන සිටි අතර, එවකට එම සභාවෙහි පාලකවරයා ලෙස කටයුතු කරනු ලැබුවේ නැසී ගිය දේවගැති පී. සුන්දරම් විසින්ය. ඔහු ඉතාමත් ශක්තිමත් අධ්‍යාත්මික නායකයෙකු වූ අතර ඔහුගේ දේව භක්තික ජීවිතය, බලවත් දේශනා කිරීම් සහ විශ්වාසවන්ත පුහුණුව තුළින් දෙවියන්වහන්සේගේ රාජ්‍යය තුළට දේව සේවකයින් දහස් ගණන් බිහි කරනු ලැබුවේය. ඔහුට අසාමාන්‍ය මතකයක් තිබූ අතර ඉරුදින දේව මෙහෙයන්ට විශ්වාසවන්තව සහභාගී වූවන් සහ නොපැමිණි අය පහසුවෙන් හඳුනා ගත හැකි විය.



ඔහුගේ නායකත්වය යටතෙහි සිටි බොහෝ විශ්වාසවන්ත සේවකයින් අතරින් කැපී පෙනෙන දෙවියන් වහන්සේගේ මිනිසුන් තිදෙනෙක් වූහ. රාජ්‍ය සේවකයෙකු වූ, දිවන් ගත සහෝදර වී. සෙල්වරාජ්, දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කළ දිවන්ගත සහෝදර වික්ටර් ස්වාමි දාස් හා කෝර්ලි උසස් පාසලෙහි සිටි දිවන්ගත සහෝදර එල්.එම්. ජේමෝහන් නොහොත් ජෙයකුමාර්ය.

බොහෝ තරුණයන්ට මෙන් මගේ රජයේ රැකියාව නිසා මටද සභාවේ සේවාවන් වලට සහභාගී වීමට නොහැකි වූ අවස්ථාවන් තිබුණි. එවැනි අවස්ථාවන්වලදී මෙම කැපවූ දෙවියන් වහන්සේගේ සේවකයන් පොලිස් නිලධාරීන්ගේ සුපරීක්ෂාකාරීත්වයෙන් මෙන් වෙහෙස නොබලා, මා පසුපස පැමිණ මගේ සේවා ස්ථානයේ ආපනශාලාවල සහ වෙනත් ස්ථානවලට මාව සොයාගෙන පැමිණුනේය. ඔවුන් ඉතා ප්‍රේමණීය උපදෙස් ලබා ලබා දී විශ්වාසවන්තව සභාවේ සේවාවන්ට සහභාගි වීමේ සහ සෑම ක්‍රියාකාරකමකටම සක්‍රියව සහභාගිවීමේ වැදගත්කම සහ ආශීර්වාදයන් සබන්ධව මට ඉගැන්නුවේය.

ඔවුන් කැමැත්තෙන්ම ඔවුන්ගේ කාලය මුදල් සහ ශක්තිය වැය කරනු ලැබුවේ මාව නිවැරදි ආධ්‍යාත්මික මාර්ගය තුළ තබා ගන්නා පිණිසය. ඔවුන්ගේ ශ්‍රමය සහ කැපවීම නිසා මගේ අධ්‍යාත්මික ජීවිතය හැඩ ගැස්වීමේදී වැදගත් කාර්යයක් ඉටු කළ බවට මට විශ්වාසයෙන් සාක්ෂි දිය හැකිය. ඔවුන් යම් යම් කාරණා සම්බන්ධයෙන් ඉතා දැඩි වුවත් ඔවුන් ඉවසිලිවන්තව දයානුකම්පිතව සහ මා වැනි තරුණු ඇදහිලිවන්තයෙන් හික්මවීමට ගැඹුරින් කැපවී සිටියහ.

පසුව ස්වාමීන් වහන්සේ උන්වහන්සේගේ ***කැඳවීමේ ප්‍රතිරාවය සේවයට*** කරුණාවෙන් ආශිර්වාද කළ විට, මෙම පුරුෂයින් පිය සෙනෙහසින් යුතුව තම උපකාරක දෑත් දිගු කරනු ලැබුවේය. ඔවුන් දේශනා කිරීම සහ විශේෂ රැස්වීම් සඳහා අපගේ සභාවන්වල නිතිපතා සේවය කළහ. ඔවුන් මගේ ජීවිතයට පමණක් නොව දහස් ගණන් පුරුෂයින් නිසා කාන්තාවන්ගේ ජීවිතවලට දීර්ඝ කාලීන බලපෑමක් ඇති කළ බව මම තරයේ විශ්වාස කරමි.

## MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines :English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikaans.
3. **BIBLECOR -** Basic Bible Courses (English, Tamil & Hindi)
4. Theological Correspondence Courses: English & Tamil
5. Nehemiah Bible Colleges (Chepauk, Santhoshapuram & Velachery)
6. Branch Churches: Santhoshapuram, Balaji Nagar & Velachery
7. Great Commission Partners (Network of Pastors)
8. Training Programmes – Seminars & Retreats
9. Crusades
10. Literature Distribution and Follow Up
11. Gospel Printing Press - Publications
12. St. Paul's Matriculation School - Village English High School
13. Sunday Schools (Chepauk) : 10.30 a.m. Sunday & (Velachery, Balaji Nagar & Santhoshapuram) 3.00 p.m. Sunday
14. **Early Morning Service : 5.30 a.m. Sunday**
15. **Preliminary Service : 8.00 a.m. Sunday**
16. **Tamil Service : 8.30 a.m. Sunday**
17. **Youth Meeting : 11.00 a.m. Sunday**
18. **Fellowship Lunch : 1.00 p.m. Sunday**
19. **Telugu Service : 4.00 p.m. Sunday**
20. **Hindi Service : 5.00 p.m. Sunday**
21. **Tamil & English Service : 6.00 p.m. Sunday**
22. Feedback Time : 7.30 p.m. Sunday
23. Women's Prayer : 5.30 p.m. Wednesday
24. Hindi Prayer : 7.00 p.m. Wednesday
25. Men's Prayer : 7.30 p.m. Friday
26. Discipleship Meeting : 6.00 p.m. Saturday
27. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
28. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
29. Ministers' Meeting : 5.30 p.m. First Saturday
30. Parents' Prayer : 4.00 p.m. First Sunday
31. Night Prayer : 9.30 p.m. Third Friday
32. Fasting Prayer : 9:30 a.m. Second Saturday
33. Holy Communion : Second Sunday Service
34. Youth / Kid Prayer : 10.00 p.m. daily (over phone)
35. Staff Devotion : 9.00 a.m. daily
36. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

ඔවුන්ගේ මග පෙන්වීම යටතේ හැඩ ගැසුණු සහ මග පෙන්නන ලද අය, සභාවට සහ එහි දේව ගැතිවරයාට



විශකිව යුතු ලෙස පුහුණු කරන ලදී. ඔවුන් වෙහෙස මහන්සි වූයේ පුද්ගලික පිළිගැනීමක් සඳහා නොව දෙවියන් වහන්සේගේ මහිමය සඳහා පමණි. ස්වාමීන් වහන්සේ ඔවුන්ගේ මතකයන් සහ ඔහුගේ පරම්පරාවට බහුල ලෙස ආශිර්වාද කරන සේක්වා.

අද දින සභාවල මෙතරම් කැප වූ පරාර්ථකාමී සහ විශ්වාසවන්ත පුරුෂයින් සහ කාන්තාවන් දෙවියන්වහන්සේ නැවත වරක් නැගිටුවන ලෙස මම ප්‍රාර්ථනා කරමි.

**************

Posted at "Egmore RMS Patrika Channel" RNI NO. TN/SIH/2006/17846

*....Contd. from page 7*

විපත්තියක් ලෙස ආරම්භ වූ දෙය අවසානයේ ජනතාව අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා බොහෝ සෙයින් නැවත ගොඩනැගීමේ උත්සාහය ශක්තිමත් කළේය.

දෙවියන් වහන්සේගේ තම අරමුණ ප්‍රකාශ කරන විට (හග්ගයි 2)

එය ඉටුකිරීම සඳහා උන්වහන්සේ මිනිස් පද්ධති නැවත සකස් කරන සේක. (එස්රා 6)

මේ මාසයේදී දෙවියන්වහන්සේ ඔබට විරුද්ධව කතා කරන සෑම විරුද්ධවාදී වචනයක්ම අහෝසි කර ඔබට හානි කිරීමට අදහස් කරන සෑම සැලැස්මක්ම ඔබගේම වාසියට හරව පිණිස මම යාච්ඤා කරමි. උන්වහන්සේගේ ජනතාවගේ ජීවිත තුළ උන්වහන්සේගේ අරමුණ ඉටු කර ගැනීම සඳහා උන්වහන්සේට මුළු සැලැස්ම නැවත සකස් කළ හැකි නම් අද ඔබගේ ජීවිතය තුළද උන්වහන්සේට එසේම කළ හැකිය. උන්වහන්සේගේ ඇස් ඔබ දෙස බලා සිටියි.

අපි කළ යුත්තේ උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීම පමණි. කුරුසියේ පෙන්නුම් කළ උන්වහන්සේගේ ප්‍රේමය අපමණයි. අපට ජයග්‍රාහී ලෙස ජීවත් වීමට හැකිවන පරිදි යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කුරුසේ මියගියේය.

එබැවින් ඔබගේ විශ්වාසය මැවුම්කරු කෙරෙහි පමණක් තබන්න.

*************

**NOTICE**

Save our mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (main numbers) in your mobile phones. - Editor

# ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

Annual Subscription : Rs. 100/- Life Subscription : Rs. 2000/-

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :
ECHO OF HIS CALL
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS Patrika Channel"**
**on 2nd JULY 2026.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

*JESUS LOVES YOU!*

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**